# විප්‍රවාසීන් දකින මව් බිම



## කස්තිරම

ඩී බී කුරුප්පු

**.....එසේ වූ කල්හි සිංහලෙන් ලියන විප්‍රවාසී සිංහලයන්ගෙ පොත පතට ශ්‍රී ලංකාව ගැන - එහි දිවිය ගැන - විස්තර විවරණ හා විවේචන ද ඇතුළත් වීම පුදුමයක් නොවේ. රට හැර ගිය උදවියට රට ගැන විවේචනයක් කිරීමට අයිතියක් නැතැයි කියන්නෝද සිටිති. එහෙත් අද ලෝකයේ කිසිම ජනතාවකට එසේ වැල්ලේ ඔළුව සඟවාග න්නට බැරිය. ඔවුන් ගැන කතා කිරීමට ඔවුන්ගේ අවසර අවශ්‍යද නොවේ.**

සිඩ්නි වාසී බර්ගර් ජාතික ගායිකාවක වන චේරින් කෙලාර්ට් ලියූ Father O Mine නම් පොත කියවීමේ දී මගේ සිතට තදින් කා වැදුණු ලක්ෂණ දෙකක් ඇත. එකක් සැඩ සුළඟක් පරිද්දෙන් වේගයෙන් දිව යන සිය දිවිය විස්තර කිරීමේ දී ඇය වෙතින් පළ වන විවෘත භාවය සහ ආත්ම ශක්තියයි. දෙවැන්න තමා උපන් ඇති දැඩි වුණු රටට - එනම් ශ්‍රී ලංකාවට - ඇය තුළ පවත්නා ළැදියාවයි. යළි යළිත් එහි යන්නට ඇති නොතිත් ආසාව ය.

එසේ වූ කල්හි සිංහලෙන් ලියන විප්‍රවාසී සිංහලයන්ගේ පොත පතට ශ්‍රී ලංකාව ගැන - එහි දිවිය ගැන - විස්තර විවරණ හා විවේචන ද ඇතුළත් වීම පුදුමයක් නොවේ. රට හැර ගිය උදවියට රට ගැන විවේචනයක් කිරීමට අයිතියක් නැතැයි කියන්නෝද සිටිති. එහෙත් අද ලෝකයේ කිසිම ජනතාවකට එසේ වැල්ලේ ඔළුව සඟවාග න්නට බැරිය. ඔවුන් ගැන කතා කිරීමට ඔවුන්ගේ අවසර අවශ්‍යද නොවේ.

සිංහල භාෂාව හා සාහිත්‍යය ගැන නම් ඒ විදියේ ව්‍යාජ සීමා බන්ධනයකට පවා ඉඩක් නැත. විප්‍රවාසී සිංහලයන් සිංහලෙන් ලියන්නේ බස ගැන - සාහිත්‍යය ගැන තවමත් උනන්දුවක් ඇති හෙයිනි. ඔවුන් අතින් ගැම්මක් ඇති යමක් ලියැවුණොත් එයින් වන්නේ භාෂාව හා සාහිත්‍යය පොහොසත් වීමය. ඒවූ කලී බසට ලැදි හැම කෙනෙකුම අගය කළ යුතු සේවයක් ද වනු ඇත.

අප ලියන පොත පත ශ්‍රී ලංකාවේ පාඨකයා අරමුණු කොට ලිවිය යුත්තේ මේ රටේ පාඨක සංඛ්‍යාව ජන සංඛ්‍යාව අනුව මිණිය නොහැකි නිසා ය. එහිලා අප සිහි තබා ගත යුතු දෙයක් ඇත. එකක් අප වසන දේශය හා එහි ජනතාව - එම ජීවිතය පිළිබඳ සැබෑ චිත්‍රයක් ශ්‍රී ලාංකික පාඨකයා වෙත ඉදිරිපත් කිරීම ය. අනෙක් අතින් මෙරට වාසය කරන අපගේම ජනයා පිළිබඳ යථා ස්වභාවය ගැන අවබෝධයක් ශ්‍රී ලාංකික පාඨකයාට ලැබෙන අයුරින් අපේ කෘති නිර්මාණය කිරීම ය.

මෙකී දෙවැනි පක්ෂය ගැන මෙරටට සම්ප්‍රාප්ත වන ශ්‍රී ලාංකික සිංහල ලේඛකයෝ ද වරින් වර විස්තර ඉදිරිපත් කරන්නෝ ය. නිර්මාණ කරන්නෝ ය. කලකට උඩ දී ටික දිනක සංචාරයක් සඳහා ඔස්ට්‍රේලියාවට පැමිණි ශ්‍රී ලාංකික පුවත්පත් කලාවේදියෙක් 'දුප්පතුන් නැති ලෝකය' ගැන ලිපියක් ලියා තිබුණේ ය. ඊට වඩා කාලයක් මේ රටේ වාසය කළ ලේඛකයෙක් නවකතා දෙකක් ලියුවේ ය. ඔහුගේ මුල්ම කෘතිය වූ 'පුන්නජි පොඩි හාමුදුරුවෝ' මේ රටේ පන්සලක සිද්ධියක් ඇසුරෙන් රචනා කරන ලද්දකි. දෙවැන්න පොදුවේ විප්‍රවාසී සිංහලයන් ගැන කියන කතාවකි. 'අක්මුල් නැති මිනිස්සු' නම් වූ එම නවකතාවේ කියන ආකාරයට මෙහි සිටින සිංහලයෝ වැඩි දෙනා අක්මුල් සිඳ ගත්තෝ ය. කටුවට - වහල්ලට - දෙකටම අයත් නොවූවෝ ය. ලේඛකයා හී. බ. දිසානායක ය.

මෙහි පැමිණි ලේඛකයන් එසේ කීවාට එහි සිටින ප්‍රභූන් තුළ අප ගැන ඊට වඩා ගෞරවයක් පවත්නා බව මෙරට ලේඛකයකුගේ කතාවක එන විස්තරයකින් ප්‍රකාශ වන්නේ ය. ලේඛකයා පියසේන පියසිරි ය. ඔහුගේ 'රටකින් එහා' (2005) නම් කෙටිකතා එකතුවේ 'උත්තම පුරුෂයා' නමින් කතාවක් ඇත . එයින් කියැවෙනුයේ නිවාඩුවට ගම රට බලා ගිය මෙහි වසන්නකු ලිඳක වැටුණු දරුවකු බේරා ගැනීමට දරන නිෂ්ඵල ප්‍රයත්නය ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන්ගේ ප්‍රශංසාවට ලක් වන ආකාරයයි. දැරියගේ අවමඟුලේ දී අනුශාසනාවක් කරන උන් වහන්සේ මෙසේ කියති.

''... විශේෂයෙන් සඳහන් කළ යුත්තේ එම විපත්තිදායක අවස්ථාවේ එම දැරියගේ ජීවිතය බේරා ගැනීම සඳහා ජීවිත පරිත්‍යාග යෙන් කටයුතු කළ එම උත්තම පුරුෂයාගේ - අපේ පුංචි මහත්තයාගේ එම සත් ක්‍රියාව ගැන ය. මේ සතර දිසාවේ බොහෝ කලක් රැව් පිළිරැව් දෙන එම වීර ක්‍රියාව තවත් වැදගත් වනුයේ ඒ සැදැහැවත් මහත්මා ...... ස්වකීය ප්‍රේමණීය මෑණියන් දැක බලා ගැනීමට මව් බිමට සම්ප්‍රාප්ත වූ අවස්ථාවක මෙය සිදුවීම නිසා ය'' (රට සිට පන්සලට ආධාර කරන බවද ඒ අතරම පවසන බව නොකිවමනා ය)

***ඒ කාලෙ අපි ආපු***
***කොයි තරම් සුන්දරද***
***හැම තැනම සුදු අයයි***
***අපියි බර්ගර් අයයි***

*'බොඳ වූ ලොව' - පාලිත ගනේවත්ත*

හාමුදුරුවන් අර විදියට කීවාට පොදුවේ ශ්‍රී ලාංකිකයන් විප්‍රවාසී සිංහලයන් වෙත යොමු කරන්නේ එතරම් හිතකර බැල්මක් ද යන්න සැක සහිතය. හී බ දිසානායක ගේ දෘෂ්ඨි කෝණයෙන් බලන ලේඛකයන් මෙන්ම පොදු ජනයා ද සිටිය හැකි ය. එය තහවුරු කරන විදියේ ආකල්පයක් මෙරටට මුලින්ම පැමිණි සිංහලයන් සමහරකු තුළ පැවති බව කියනු ලැබේ. එයින් ප්‍රකාශ වූයේ අලුතින් එන පහත් ගණයේ වෘත්තිකයන් කොන් කරන - හෙළා දකින ස්වභාවයකි. දැන් දැන් අතුරුදන්ව යන එම ආකල්පය පිළිබිඹු වන කවි පෙළක් පාලිත ගනේවත්ත ගේ මුල්ම කාව්‍ය සංග්‍රහය වූ 'බොඳ වූ ලොව'ට ඇතුළත් ය. කොටසක් උපුටා දක්වමි.

''ඒකනේ ඔය ඉන්නෙ හැම ලපයි සිපයියම
කවදාක පිට රටක පය ගහපු අය ද මුන්

ඒ කාලෙ අපි ආපු කොයි තරම් සුන්දරද
හැම තැනම සුදු අයයි අපියි බර්ගර් අයයි

නිතරෝම කන වැටුනෙ ඉංගිරිසි කතාවයි
දැන් ඉතින් සිංහලිස් ඉරිදා පොළ වගේමයි

මේ මගුල් ඔසීලගෙ අලුත් ප්‍රතිපත්තියනෙ
මල්ටිකල්චරලිස්ම් හරිම මල කෝලමක්

වැඩක් නෑ මුන් එක්ක දැන් ඉඳල මේ රටේ
එංගලන්තෙට යමුකො එහෙ ඉඳිමු හැමදාම

එහෙත් දැන් මේ වගේ අපේ උන් වැහි වැහැල
අපේ හැතිකරේ දැන් හැම රටම වනසලා''

මෙහි සිටින අපේ නවකතාකරුවෝ සියලු දෙනාම පාහේ මව් බිමේ සිදුවීම් හා ජීවිත තොරතුරු සිය නිමැවුම් වලට අඩු වැඩි වශයෙන් ඇතුළත් කරති. විනීතා තලේරත්න (සයුරෙන් එහා) සමන් මහානාම දිසානායක (බඹරැන්දේ කඟවේනා සහ අනෙක් කතා) බඳු ලේඛකයන්ගේ කතාවල සෑහෙන කොටසක් ශ්‍රී ලංකාවේ ම සිදුවන්නේ ය. හේමමාලා හේරත් (උත්තරා) බඳු අයගේ නවකතාවල ටික දවසකට ගම රට බලා ගොස් මදුරුවන්ගෙන් රස්නයෙන් හා පාරේ වාහන තදබදයෙන් පීඩා විඳින විප්‍රවාසීන් දක්නට ඇත .

සිය මව් බිමේ කියුම් කැරුම් හා ආකල්ප හාස්‍යයට - උපහාසයට ලක් කරන්නෝද ඇත. ලක්ෂ්මන් කොඩිතුවක්කු ගේ 'පැය අටේ මිත්‍රයෝ' කවි එකතුවේ එන දෙතැනක් උපුටා දක්වමි. එකකින් දේශපාලකයන්ගෙන් යැපෙන - ඔවුන් නිසා බැට කන - අසරණයකු ගැන කියන්නකි. 'පොස්ටර් අලවන්නා කී කවිය' හි කොටසක්.

''ගුටි කාලා ලේ නහරත් නලියනවා
දින කිහිපයක් රෝහල තුළ වැතිරෙනවා
එකලා මාව සියලු දෙනට අමතක මුත්
මගේ මෑණී මාව බලන්නට එනවා

පාප්පයා මා කවුරුත් අමතනවා
මුඩුක්කුවේ කොයි කවුරුත් අඳුනනවා
ඇවැසිදාට ලොකු ලොක්කෝ පියාඹලා
ඔලුව නමා මාව බලන්නට එනවා''

පියසේන පියසිරි මව් බිමේ සිදුවීම් දෙස බලන්නේ ද සුපුරුදු උපහාසයෙන් යුතුව ය. ඔහුගේ 'රටකින් එහා' (2002) කෙටිකතා එකතුවේ එන කතා දෙකකින් මෙයට නිදසුන් දැක්විය හැකි ය. මේ 'යළි උපන්නෝ' නම් කතාවේ එන විස්තරයකි.

''කලක් මම ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අප්‍රසිද්ධ ගිණුම් ලිපිකරුවකු ලෙස රාජකාරි කළෙමි. නව පන්නයේ උස ගොඩනැගිලි අතරට අපේ කාර්යාල ගොඩනැගිල්ල අරියාදුවට සිටියා වගේ ය. කසි කබල් බිත්ති වවුලන් එල්ලුණ පරාල අඬා වැටෙන තරප්පු පේලි වැඩ දෙපාර්තමේන්තුව ගැන රහසේ යමක් කියනවා වැන්න. හතර වටේ වැවී තිබුණු රූස්ස මාර ගස් අතුපතර විහිදා ගොඩනැගිල්ලම වසා දැමීය. ඒ තුළ කෙරෙන වැඩ කටයුතු උඩ සිටින දෙවි වරුන්ට නොපෙනෙනවා විය හැකිය. මාර ගස් මුදුන් වල කූඩ ගින්නේ අතොරක් නැතිව කෑ කෝ ගසන කපුටෝ දහස් ගණනක් ලැග සිටියහ. නගරය පුරා ඇද හැලෙන කැළි කසළ තොගය බාරව කටයුතු කරන මේ කපුටු සේනාව දිවා රාත්‍රී අප කාර්යාලය වෙත යන එන උදවිය මත හෙළන වර්චස් වරුෂාව අතිමහත් ය. මෙය කොපමණ බැරෑරුම් ප්‍රශ්නයක් වූයේ ද යත් ''ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට යන්නේ නම් මිනී කාක්කන්ට දීමට මාරු සල්ලි යහමින් ගෙන යා යුතු වා මෙන් ම කපුටු බෙට් වලින් බේරීමට කුඩයක් ද ගෙන යා යුතු ය'' යන උපදේශය කටින් කට පැතිරී ගිය සැටි අපට මතකය''

***"රථ වාහන තද බදය ගැන මම සිත යොමු කළෙමි. කිසිවකු තව කෙනෙකුට ඉඩ නොදෙමින් තමාටම බැණ වදිමින් ලෝකයටම ශාප කරමින් යන රියැදුරන්ගෙ එකම විනෝදාංශය නළා පිඹීම ය. වළාකුල් අතුරින් එල්ල වූ දැඩි හිරු රැස් අවට පරිසරයම දවාලයි. මස් කඩයක එල්ලා ඇති නරක් වීමට ආසන්න යෝධ ඌරකුගේ මළ කුණක් වසා ගෙන මැස්සන් දඟලති. මැස්සන් එළවීම සඳහා සකස් කළ විශේෂ ඉලපතක් අතින් ගත් මස් කඩකරු විටින් විට දෙන පහරින් මැස්සන් දහස් ගණනක් එකවර මිය යති."***

*'මාතලී' - පියසේන පියසිරි*

'මාතලී' නම් කතාවෙහි ලා ඔහුගේ අවධානය යොමු වන්නේ වෙනස් පැත්තකටය.

''රථ වාහන තද බදය ගැන මම සිත යොමු කළෙමි. කිසිවකු තව කෙනෙකුට ඉඩ නොදෙමින් තමාටම බැණ වදිමින් ලෝකයටම ශාප කරමින් යන රියැදුරන්ගේ එකම විනෝදාංශය නළා පිඹීම ය. වළාකුල් අතුරින් එල්ල වූ දැඩි හිරු රැස් අවට පරිසරයම දවාලයි. මස් කඩයක එල්ලා ඇති නරක් වීමට ආසන්න යෝධ ඌරකුගේ මළ කුණක් වසා ගෙන මැස්සන් දඟලති. මැස්සන් එළවීම සඳහා සකස් කළ විශේෂ ඉලපතක් අතින් ගත් මස් කඩකරු විටින් විට දෙන පහරින් මැස්සන් දහස් ගණනක් එකවර මිය යති.''

ලක්ෂ්මන් කොඩිතුවක්කු ගේ 'විවෘත ආර්ථිකය' නම් කවකින්ද පළවන්නේ එබඳුම උපහාසයකි.

''දැන් අපේ ගමේ කුලියට නිමවෙන
යන්ත්‍රානුසාරයෙන් කැරකෙන
සේර්වාණිජ කථා වස්තුවෙන් හැඩ වුණ
ගම් තුලානෙ සත් ගුණවත් මුදලාලිගේ ධනයෙන් නිමවන
බුද්ධාලම්බන ප්‍රීතියෙන් පුදකළා වූ
ගමේ උදවියට
කාසි දී නරඹන්නට සිදුවන හැටි''

චන්ද්‍රා මල්ලවාරච්චිගේ ''ගැහැනිය'' නම් වූ කාව්‍ය සංග්‍රහයේ (2003) එන 'පුරාජේරුව' නම් කවෙන් එල්ල කැරෙන උපහාසදය ඒ සියල්ලටම වඩා දරුණු ය.

''ඉතිහාසය ගැන මහ විරුවන්ගේ
පුරාජේරු ගැන දෙඩුවත් අප සැම
සිංහලයන්ගේ එකමුතු කම ගැන
කඳුලක් උපදී නිති දෙනුවන් අග

සිහලුන් අප යයි කෑ මුර ගාගෙන
මහාවංශය සිරසේ රඳවාගෙන
සඳකඩ පහනින් හෙළුව වසාගෙන
සිටියොත් සුරැකේවිද සිංහල කම''

මේ පණිවුඩය
ශ්‍රී ලංකාවට භාණ්ඩ යවන ඔබටයි

**ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීමට අදාලව
පනවා ඇති නව නීති රෙගුලාසි නිසා
පහත දැක්වෙන භාණ්ඩ
රට තුළට ගෙන ඒම තහනම් බව
කරුණාවෙන් සළකන්න**

Restricted & Prohibited Items

- Remote controlled toys
- Colour Printers / Scanners
- Telephones /Satellite phones
- Mobile phones
- Fax Machines
- Used Air Conditioners ( containing CFC)
- Used Refrigerators ( containing CFC)
- Used Dee Freezers ( containing CFC)
- Colour Photo copiers
- Helmets
- Batteries
- Live plants or animals
- Parts of plants or animals

**මෙවැනි භාණ්ඩ නිෂ්කාශනයේදී
රේගුව විසින් රඳවා ගනු ලැබීමට ඉඩ ඇති බැවින්
ඒවා නැව්ගත කිරීමෙන් වළකින්න**

Please beware that these items will be detained by the customs at point of clearance and it is advisable to avoid sending such items at all time.

If you need any further details please call

Transco

93577228 or 9703 2255